# දැන්වීමයි

## නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

**2008 අංක 35 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ මාධ්‍ය නිලධාරී තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

තනතුර : **මාධ්‍ය නිලධාරී (JM 1-2) - තනතුරු 01**

රැකියා විස්තරය : **2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම :**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 සමග 5 හෝ 6 සමග 7)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනමාධ්‍ය/ ජනසන්නිවේදනය/ අලෙවිකරණය/ පුවත්පත්‍ර කලාවේදී උපාධියක් ලබා තිබීම

හෝ

02. ජනමාධ්‍ය ජනසන්නිවේදන හෝ අලෙවිකරණ පුවත්පත්‍ර කලාවේදී අංශයන්ගේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයකින් ලබාගත් අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම

හෝ

03. ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමේ සහතිකයක් හෝ ඊට සමාන ජාතික තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පිළිගනු ලබන තාක්ෂණ /වෘත්තීය/ කළමනාකරණ පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ජන මාධ්‍ය/ ජනසන්නිවේදන/ අලෙවිකරණ/පත්‍ර කලාවේදී සහතිකයක් ලබා තිබීම

හෝ

04. ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සහතිකයක් හෝ ඊට සමාන ජාතික තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පිළිගනු ලබන තාක්ෂණ /වෘත්තීය/ කළමනාකරණ පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ජනමාධ්‍ය/ ජනසන්නිවේදන/ අලෙවිකරණ/පත්‍ර කලාවේදී සහතිකයක් ලබා තිබීම

සහ

05. රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පෞද්ගලික ආයතනයක ප්‍රවර්ධන/ මාධ්‍ය/ ප්‍රචාරණය කටයුතු පිළිබඳ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

06. ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමේ සහතිකයක් හෝ ඊට සමාන ජාතික තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පිළිගනු ලබන තාක්ෂණ /වෘත්තීය/ කළමනාකරණ පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ජනමාධ්‍ය/ ජනසන්නිවේදන/ අලෙවිකරණ/පත්‍ර කලාවේදී සහතිකයක් ලබා තිබීම

සහ

07. රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, හෝ පෞද්ගලික ආයතනයක ප්‍රවර්ධන/ මාධ්‍ය/ ප්‍රචාරණය කටයුතු පිළිබඳ වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම

**වෙනත් සුදුසුකම් :**

**සෑම අයදුම්කරුවෙකුම ,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වයස** : අවු.22ට නො අඩු හා අවු.45ට නො වැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු43,355 - 10X755- 18X1,135- රු 71,335
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව)

**පොදු :**

**(අ) සුදුසුකම් ලබන දිනය :**

සේවයට/තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

**(ආ) පත්වීමේ ස්වභාවය :**

තනතුර ස්ථිරය.සේවක අර්ථසාධක අරමුදල(EPF)වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10%ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF)වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක්.

**අයදුම්පත්‍ර එවීම :**

පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීවදත්ත සහ අදාළ සහතික වල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතික වල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෑතකදී ලබාගත් චරිත සහතික 2ක් සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ උප්පැන්න සහතිකය, ග්‍රාම නිලධාරී සහතිකය, පොලිස් වාර්තාව, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතික වල ඡායාපිටපත් අමුණා විස්තර සහිතව සම්පූර්ණ කළ අයදුම්පත් 2020.12.22 වෙනිදට හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ hrdmepa@gmail.com යන ඊමේල් ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ සහ ඊමේල් පණිවුඩයේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත් සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

තැපෑලෙන් අස්ථානගත වන හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

**සභාපති,**
**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,**
**අංක 177, නාවල පාර,**
**නාරාහේන්පිට, කොළඹ 05.**

Source: Dinamina, Daily News (2020.12.08)